# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## බරීරා මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලය
## (සංස්ථාගත කිරීමේ)

**බරීරා මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. එස්. තව්ෆික් මහතා විසින්
2016 අප්‍රේල් මස 05 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 පෙබරවාරි මස 23 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[96 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

# බරීරා මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ)

## බරීරා මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

**පූර්විකාව.**

''බරීරා මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලය'' නම් වූ විද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය එකඟ වූ රීති අනුව එකී විද්‍යාලයේ පරමාර්ථ සහ ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් එම විද්‍යාලය ශ්‍රී ලංකාවේ මහනුවර දිස්ත්‍රික්කයේ මාවතුපොළ අකුරණ - 09 යන ස්ථානයේ පිහිටුවා තිබුණු හෙයින් ද :

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී ආයතනය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

**1.** මේ පනත 2016 අංක      දරන බරීරා මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**බරීරා මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලය සංස්ථාගත කිරීම.**

**2.** මේ පනත ක්‍රියාත්මක වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු ''විද්‍යාලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''බරීරා මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලයේ '' දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හා මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''බරීරා මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලය'' යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේ ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද, තම ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය එම සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ඉස්ලාමීය ''ෂරියා'' නීතිය යටතේ සමාජයට මග පෙන්වීමට සමත් ඉස්ලාමීය දේවධර්මවාදීන් බිහි කිරීම;

(ආ) ඉස්ලාමීය ධර්මය ආරක්ෂා කිරීම ;

(ඇ) ශුද්ධ වූ කුරාණය කටපාඩමින් දන්නා හසීඩ්වරුන් බිහි කිරීම ;

(ඈ) ඉස්ලාමීය සමාජය තුළ සමගිය ප්‍රවර්ධනය කිරීම සහ පෝෂණය කිරීම සහ ඉස්ලාමීය සමාජයේ ප්‍රශ්නවලට පිළිතුරු සෙවීම ;

(ඉ) ඉස්ලාමීය සමාජයේ ''සුන්නත් වල් ජමාත්'' ප්‍රතිපත්තිය ප්‍රවර්ධනය කිරීම ;

(ඊ) අල් කුරානය සහ හදීස්වලට අනුකූලව ඉස්ලාමීය ධර්මය අරාබි භාෂාවෙන් ඉගැන්වීම සහ ඉගෙන ගැනීම ;

(උ) සිංහල, දෙමළ, උර්දු යන භාෂාවන් ඉගැන්වීම ;

(ඌ) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අනුමත කර ඇති විෂය මාලාව මත පදනම්ව ඉස්ලාමීය ධර්මය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලබා දී ඔවුන්ව අ.පො.ස. (සා.පෙ) හා අ.පො.ස. (උ.පෙ) විභාගවලට සූදානම් කරවීම ;

(එ) මුස්ලිම් කාන්තාවන්ගේ සමාජයීය, ආර්ථික සහ අධ්‍යාපන දියුණුව සඳහා වෙනම ඒකකයක් පිහිටුවා එය නඩත්තු කිරීම ;

(ඒ) ෂාෆි නිකායේ ෆික් නීති (සංකල්ප පිළිබඳ ගුරුකුලය) සහ ''අල් අෂ්අරියා'' විශ්වාසය සහ ශුද්ධ වූ ''තබ්ලිත්'' මත පදනම් වූ සුන්නත් වල් ජමාත් ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම සහ පෝෂණය කිරීම;

(ඔ) සංස්ථාවේ මතය අනුව ඉහත සඳහන් යමකට සම්බන්ධ සහ විද්‍යාලයේ සංවර්ධනයට උපකාරී වන වෙනත් සියලු දේ ඉටු කිරීම;

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.**

**4.** (1) සංස්ථාවේ කළමනාකරණය, පාලනය සහ පරිපාලනය මේ පනතේ විධිවිධානවලට යටත්ව සංස්ථාවේ සභාපති, උප සභාපතිවරුන් දෙදෙනකු, සම ලේකම්වරුන් දෙදෙනකු, භාණ්ඩාගාරික, සහකාර භාණ්ඩාගාරික සහ කාරක සභිකයන් අට දෙනෙකු ඇතුළුව සමාජයේ නායකන් සහ දේව ධර්ම ශාස්ත්‍රඥයන් වන තැනැත්තන් අතුරින් සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන සාමාජිකයන් පහළොස් දෙනෙකුගෙන් සමන්විත වන කළමනාකරණ මණ්ඩලයක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය. සම ලේකම්වරුන් දෙදෙනාගෙන් එක් අයකු විද්‍යාලයේ ගුරුවරයෙකු විය යුතු ය.

(2) සංස්ථාවේ පළමු නව කළමනාකරණ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරන විද්‍යාලයේ පාලක මණ්ඩලය විය යුතු අතර, එම පාලක මණ්ඩලය, සංස්ථාවේ රීතිවලට අනුව නව පාලක මණ්ඩලයක් පත් කර ගන්නා තුරු ධුර දැරිය යුතු ය.

(3) සංස්ථාවේ නිලතල දරන්නන් එක් අවුරුද්දක කාලයක් සඳහා ධුර දැරිය යුතු අතර, නැවත තෝරා පත්කර ගැනීම සඳහා ඔවුන් සුදුස්සන් වෙති.

**කාරක සභිකයන්ගේ සුදුසුකම්.**

**5.** කාරක සභිකයකු —

(අ) "ෂරියා" නම් වූ ඉස්ලාමීය නීති රීතිවලට අනුකූලව ජීවත්වන තැනැත්තකු විය යුතු ය. ;

(ආ) යහපත් චරිතයක් ඇති එමෙන් ම ඉස්ලාමීය සමාජය විසින් ගරු කරනු ලබන තැනැත්තකු විය යුතු ; සහ

(ඇ) "ෂරියා"නීතියට සහ දේවධර්මවාදයට ගරු කරන තැනැත්තකු විය යුතු ය.

**සංස්ථාවේ සාමාන්‍ය බලතල.**

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, බැංකු ගිණුම් ආරම්භ කිරීම ක්‍රියාත්මක කිරීම හා වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම,

ප්‍රදාන සහ පරිත්‍යාග පිළිගැනීම එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජන යෙදවීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම හා සේවයෙන් පහ කිරීම ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් හෝ ඉටු කර ගැනීම හෝ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය දේ කිරීමේ ඉටු කිරීමේ, සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

**7.** (1) සංස්ථාව විසින් සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කළ සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. සංස්ථාවේ රීති.

(අ) සංස්ථාවේ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම සහ ඔවුන් සාමාජිකත්වයෙන් නෙරපීම ;

(ආ) නිලධරයන් තෝරාපත් කර ගැනීම ;

(ඇ) සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලයේ සහ නිලධරයන්ගේ බලතල කාර්ය හා කර්තව්‍ය ;

(ඈ) කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම සහ එම රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ එම රැස්වීම්වල ගණපූරණය ;

(ඉ) සංස්ථාවේ සේවා නියුක්තයන් පත් කිරීම සහ ඔවුන්ගේ කාර්ය සහ කර්තව්‍ය සහ එම සේවා නියුක්තයන් විසින් අනුගමනය කළ යුතු ආචාර ධර්ම පද්ධතිය ;

(ඊ) අදාළ රීති ජාතික හෝ පළාත් අධ්‍යාපන ප්‍රතිපත්තිවලට පටහැනි නොවන තාක් දුරට, පැවැත්විය යුතු අධ්‍යාපන පාඨමාලා, අධ්‍යාපන විෂය මාලා, විභාග සහ සහතික ප්‍රදානය කිරීම ;

(උ) සංස්ථාවේ දේපල පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම හා එහි අරමුදල්වල භාරකාරත්වය ; සහ

(ඉ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ ඒ අරමුණු සාක්ෂාත් කර ගැනීම ;

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් රීතියක් සාදනු ලැබිය හැකි ආකාරයෙන් ම සංස්ථාවේ යම් රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

විද්‍යාලය විසින් සහ විද්‍යාලයට අයවිය යුතු ණය.

**8.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ විද්‍යාලයෙහි පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට විද්‍යාලයට අය විය යුතු සියලු ණය, දායක මුදල් සහ ආධාර මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**9.** සංස්ථාවේ මුද්‍රාව මණ්ඩලය විසින් නිසි පරිදි බලය පවරනු ලැබූ තැනැත්තන් ඉදිරිපිට දී හැර කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඔවුන් විසින් තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ ගිණුම්.

**10.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාවේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම්, වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව යථා පරිදි ගිණුම් තැබීමට සංස්ථාව කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට

ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

**සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.**

**11.** යම් මිලට ගැනීමක්, දායක මුදලක් ත්‍යාගයක්, ප්‍රදානයක් තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලැබූ චංචල හෝ නිශ්චල යම් දේපල අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, එකී දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් ව, ඒ සියලු දේපල සංස්ථාව විසින් දැරිය යුතු ය.

**විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපල.**

12. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපලක් ඉතිරි වුවහොත් ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර, බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායම් හෝ දේපල ස්වකීය සාමාජිකයන් අතර, බෙදා දීම තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

**ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

13. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

14. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.